



සර්ව රාත්‍රික පරිත්‍රාණ පිරිත් දෙසුමෙන්....

# ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් මෙරටට සුවිශාල මෙහෙවරක් කළ මහා යුග පුරුෂයෙක්

## 139 වැනි ජන්ම දින සැමරුම් පින්කමේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර නාහිමියෝ කියති

**නෙරංජලා වික්‍රමසිංහ සහ තරුෂි අධිකාරි**

ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් සාමාජීය, ආගමික වශයෙන් මෙන්ම ව්‍යවසායකයෙක් වශයෙන් ද මෙරටට සුවිශාල මෙහෙවරක් කරන ලද මහා යුග පුරුෂයකු යැයි කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක මහා විහාරාධිපති, ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ දකුණු ලංකාවේ උප ප්‍රධාන සංඝනායක, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර නාහිමියෝ පැවැසූහ.

උන් වහන්සේ මෙලෙස පැවැසුවේ දිවංගත ඩී.ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ 139 වැනි ජන්ම දින සැමරුම නිමිති කරගෙන ලේක්හවුස් ආයතනයේදී මහා සංඝරත්නය විසිපස් නමක් විෂයයෙහි ඊයේ (25) දහවල් පැවැති සංඝගත දක්ෂිණාවට එක්ව අනුශාසනාවක් කරමිනි.

ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන මහතාගේ 139 වැනි ජන්ම දින සැමරුම මේ මස 23 වැනිදාට යෙදී තිබූ අතර, ඒ වෙනුවෙන් වාර්ෂිකව පැවැත්වෙන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය පෙරේදා (24) ආයතන පරිශ්‍රයේදී පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අනුශාසනා කරමින් උන් වහන්සේ මෙසේ ද කීහ.

"ජාතික සහ ආගමික සංහිඳියාවක් අපේක්ෂාවෙන් පත්තර මහගෙදර ඇති කළ විජයවර්ධනයන්ගේ බලාපොරොත්තු සඵල කරමින් අද ලේක්හවුස් ආයතනයේ සිංහල, දමිළ, මුස්ලිම් ඇතුළු සියලු ආගමික පිරිස් සහෝදරත්වයෙන්, සංහිඳියාවෙන් සේවය කරනවා. ඩී. ආර්. විජයවර්ධන මැතිතුමා වෙනුවෙන් සභාපතිතුමා ඇතුළු පාලනාධිකාරියේ පින්වත් පිරිස, සේවක මහත්ම මහත්මීන් බොහොම ගෞරවයෙන් මේ පින්කම පවත්වන්නේ ඉතාම කෘතවේදීත්වයෙන්.

මහා සත්පුරුෂයෙක් හැටියට එතුමාගේ ගුණ පිළිබඳව අපි හැමදාම සිහිපත් කරනවා. එතුමා මේ සමාජයට, රටට, දැයට, බුදු දහමට සහ සියලුම ජනතාවට එදා මෙදා තුර කළ සේවය පිළිබඳ සිහිපත් කළ යුතුයි. බොහෝ අය තමන්ගේ ධනය, දැනුම, අත්දැකීම් අනුන්ගේ සුවය, සැපත, සතුට වෙනුවෙන් වැය කරන්න මසුරුයි. ලෝබයි. අනුන්ගේ සුවය වෙනුවෙන් තමන්ගේ දෙයක් යුහුසුළුව කැප කරන අය මේ ලෝකයේ බොහොම දුර්ලභ පිරිසක් හැටියටයි සැලකෙන්නේ. ඒ අය මේ සමාජයට නොමැකෙන නමක් තබා මිය පරලොව ගියා. තමන් ලබන දැනුමක්, අත්දැකීමක්, මිල මුදලක්, වටිනා කාලයක් තවත් කෙනකුගේ සැපතක්, සුවයක් වෙනුවෙන් කැප කිරීම තමයි මහා සමාජ සේවයක් හැටියට අපට කල්පනා කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ පරිත්‍යාගය කිසිදු ලාභ ප්‍රයෝජනයක් බලාපොරොත්තු නොවී සිදු කරන්නක්. එබඳු පරිත්‍යාගයක් කළ කෙනෙක් තමයි ඩී.ආර්. විජයවර්ධන මහතා. තමන්ගේ වත්කම්, ධනය, උගත්කම, දැනුම, ශක්තිය එතුමා කැප කළේ මේ රටේ යහපත වෙනුවෙන්. මේ රටේ ජීවත් වන මිනිසුන්ගේ සැනසුම වෙනුවෙන්, මේ රටේ සභ්‍යත්වය, සංස්කෘතිය, ආගමික ආරක්ෂාව වෙනුවෙන් එතුමා කැප වුණා. ඒ නිසයි අපි එතුමා මේ විදියට අවුරුද්දෙන් අවුරුද්ද සමරන්නේ.

එතුමා කරන ලද සේවාවන් අදත් මේ සමාජයේ විශාල පිරිසකට විශාල සේවයක් සලසනවා. එදා ආරම්භ කළ මේ පුවත්පත් ව්‍යාපාරය එක පැත්තකින් සමාජයේ දැනුම වැඩි කරනවා. දැනුමේ නිම් වළලු පුළුල් කරනවා පමණක් නොව එතුමාගේ මේ ක්‍රියාවට බද්ධ වූ විශාල පිරිසකගේ ජීවනෝපායක් බවට ද පත්වෙලා තිබෙනවා. මේ පත්තර මහ ගෙදරින් පළ කරන දිනපතා වගේම සතිපතා පුවත්පත් පිළිබඳ කල්පනා කර බැලුවාම ඒවා පුංචි ළමයාගේ පටන් වයෝවෘද්ධ වූ මනුෂ්‍යයා දක්වා විවිධ සමාජ වෘත්තිකයන්ට විවිධ ආකාරයේ ඥාන සම්භාරයක් බෙදා හරිනවා. මේ ආයතනයේ පුවත්පත්වලට සම්බන්ධ වූ පිරිස එකතු වෙලා ඉන්නේ ආගමක්, ජාතියක් මුල්කරගෙන නෙවෙයි. වර්ගවාදයක් මුල්කරගෙන නෙවෙයි. මේ වහල යට බෞද්ධ වගේම වෙනත් ආගමිකයන්, සිංහල වගේම වෙනත් ජාතීන් හැමෝම එක පවුලක් විදිහට සේවය කරනවා. ඒ එදා ඩී. ආර්. විජයවර්ධන මැතිතුමා ඇති කළ ජාතීන් අතර සංහිඳියාවයි. ආගමික සංහිඳියාවයි.

එදා එතුමා මේ පුවත්පත් මහගෙදර ඇති කිරීමෙන් බලාපොරොත්තු වූයේ එකම පැත්තකින් සම ජාතික සංහිඳියාවක්, ආගමික සංහිඳියාවක් මේ සමාජයේ ඇති කරන්න. එතුමාගේ උත්සාහය සාර්ථක වුණා කියලා මම හිතනවා. අද සහෝදරත්වයෙන් එක තැනක විවිධ භාෂාවලින්, විවිධ ආගමික මාතෘකා ඔස්සේ එක මවකගේ පියකුගේ දරුවෝ සමූහයක් ලෙස ඉතාමත් සුහදව මේ පිරිස ක්‍රියා කරනවා. මේ පුවත්පත් රට පුරා බෙදා හැරීමට දායකත්වය දක්වන විශාල පිරිසක් ද මේ ක්‍රියාදාමයට සම්බන්ධ වෙලා ඉන්නවා.

ඒ අයගේ ජීවනෝපාය රැඳී තියෙන්නේ මේ පුවත්පත් නිසයි. ඒ නිසා ඩී. ආර්. විජයවර්ධන මැතිඳුන් ආරම්භ කළ මේ මහා ව්‍යාපාරයෙන් පවුල් දස දහස් ගණනක් ජීවත් වෙනවා. සමාජයේ උන්නතියට එබඳු සේවයක් කළ විජයවර්ධන මැතිතුමා සැමදාම මේ සෙවණ යට සේවය කරන හැම කෙනකුම කෘතවේදීව සිහිපත් කරනවා.

පූජනීය මහා සංඝරත්නය, ආයතනයේ විහාරස්ථානය හැටියට සම්බුද්ධාලෝක විහාරස්ථානය පිරිත් පින්කමේ සහ දානයේ මූලිකත්වය ගෙන කටයුතු කළා. විජයවර්ධන මැතිඳුන්ගේ පන්සල හැටියට ගංගාරාම විහාරස්ථානය ඒ කාලේ ඉඳලාම කටයුතු කළා. අදත් ගංගාරාම විහාරස්ථානය නියෝජනය කරමින් හාමුදුරුවන් වහන්සේලා වැඩම කළා.

එදා විජයවර්ධන මැතිතුමා ආරම්භ කළ මේ ආයතනය අද පවතින තැනට ගෙනාවේ 1919 වසරේදී. නමුත් විජයවර්ධන මැතිතුමා පත්තර ආරම්භ කළේ 1912දී පමණ. එතකොට ශත වර්ෂයකට වැඩි කාලයක් මේ ආයතනය මෙතැන පවතිනවා. අද දක්වා පවත්වාගෙන එන්න කොයිතරම් විශාල පිරිසක් තමන්ගේ කාලය, ශ්‍රමය, දැනුම කැප කරන්න ඇද්ද? පුවත්පත්වල කර්තෘවරුන්, වාර්තාකරුවන්, පරිපාලකයන්, සභාපතිවරුන් ආදී ලෙස විවිධ තනතුරු දරමින් අද දක්වා මේ ආයතනය පවත්වාගෙන යෑමට කැප වූ හැම දෙනාටමත් පින් අනුමෝදන් කිරීම අද මේ පින්කමේ පරමාර්ථයයි."

මාතර වෙහෙරහේන පූර්වාරාම විහාරාධිකාරී, රත්මලාන කොතලාවල සමාධි මධ්‍යස්ථානාධීශ්වර කෝට්ටේ කල්‍යාණ ධර්ම මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කර්මවාගාචාර්ය, සර්වඥ විශාරද, ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ පාර්ශ්වයේ දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝනායක මාපලගම පූජිශ්වර නාහිමියන්, උඩුරුව කයිකාල ශ්‍රී සුනන්දාරාමාධිපති, ගාලු පුරවරයේ ප්‍රධාන අධිකරණ සංඝනායක, ශාස්ත්‍රාචාර්ය කෝට්ටේ විජිත නාහිමියන්, ලේක්හවුස් ආයතනයේ සභාපති ගාමිණී වරුෂමාන, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සිසිර යාපා, මූල්‍ය අධ්‍යක්ෂ චන්න කිවිටියාගල, නීති හා පරිපාලන අධ්‍යක්ෂ චාමර නානායක්කාරවසම්, මෙහෙයුම් අධ්‍යක්ෂ චාමර පීරිස්, සාමාන්‍යාධිකාරී සුමිත් කොතලාවල, සමාගම් ලේකම් සුදර්ශී හේවාවසම්, ලේක්හවුස් බෞද්ධ සංගමයේ සභාපති ප්‍රියන්ත විජේසූරිය, ලේකම් නිලන්ත ගුණසේකර මහත්ම මහත්මීන් ඇතුළු ආයතනයේ සේවක සේවිකාවෝ මේ අවස්ථාවට සහභාගී වූහ.

**ඡායාරූප-**
**හිරන්ත ගුණතිලක, රංජිත් අසංක, චින්තක කුමාරසිංහ සහ දුෂ්මන්ත මායාදුන්න**



මහා සංඝරත්නය විසින් ආශිර්වාද කරමින්....



මහා සංඝරත්නයට දන් පිළිගන්වමින්...



මහසඟරුවනට පිරිකර පූජා කරමින්...



දිවංගත ඩී. ආර්. විජයවර්ධන මහතාගේ පුත්, විජය පුවත්පත් සමාගමේ සභාපති රංජිත් විජයවර්ධන, මහාභාරකාර, හිටපු මහාධිකරණ විනිසුරු ගිහාන් පිලපිටිය, ලේක්හවුස් නීති හා පරිපාලන අධ්‍යක්ෂ චාමර නානායක්කාරවසම් සහ මෙහෙයුම් අධ්‍යක්ෂ චාමර පීරිස් මහත්වරුන් ඇතුළු පිරිස සර්ව රාත්‍රික පරිත්‍රාණ පිරිත් පින්කමට සහභාගීව සිටි අයුරු.







මූල්‍ය අධ්‍යක්ෂ චන්න කිවිටියාගල, මෙහෙයුම් අධ්‍යක්ෂ චාමර පීරිස් සහ සමාගම් ලේකම් සුදර්ශී හේවාවසම් මහත්ම මහත්මීන් විසින් මහා සංඝරත්නයට පිරිකර පූජා කරමින්....



මහා සංඝරත්නය විසින් රැස්ව සිටි පිරිස පංච ශීලයෙහි පිහිටුවමින්...



මහා සංඝරත්නයට සේවක මහත්ම මහත්මීන් විසින් පිරිකර පූජා කරමින්....